කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2013

2016 - ඔක්තෝබර්

**BCOME 2045 - උසස් මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : (පහයි) 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

---

01. P සීමිත සමාගම 2014.04.01 දින Q සීමිත සමාගමේ 80% කොටස් අත්පත් කරගන්නා ලදී. අත්පත් කරගත් දින Q සීමිත සමාගමේ ස්ථාවර වත්කම් වල සාධාරණ අගය රු. 180,000 වූ අතර ප්‍රත්‍යාගණනය පොත්වල ඇතුලත් කර නොමැත. අත්පත් කරගත් දින රඳවාගත් ලාභය රු. 250,000 වන අතර පාලන නොවන බැඳීම රු. 60,000 කි. 2016.03.31 දිනට සමාගම් දෙකෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයන් පහත දැක්වේ.

| | P සීමිත සමාගම (රු) | Q සීමිත සමාගම (රු) |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල පිරියත හා උපකරණ | 350,000 | 320,000 |
| Q සීමිත සමාගමේ ආයෝජන | 400,000 | - |
| | 750,000 | 320,000 |
| **ජංගම වත්කම්** | | |
| තොග | 150,000 | 70,000 |
| ණයගැති | 68,000 | 54,000 |
| ජංගම ගිණුම් - P සීමිත සමාගම | - | 50,000 |
| මුදල් | 44,000 | 34,000 |
| මුළු ජංගම වත්කම් | 262,000 | 208,000 |
| මුළු වත්කම් | 1,012,000 | 528,000 |
| **හිමිකම් සහ වගකීම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 300,000 | 140,000 |
| රඳවාගත් ලාභ | 450,000 | 316,000 |
| | 750,000 | 456,000 |

| | | |
|---|---|---|
| ජංගම නොවන වගකීම් | 100,000 | 20,000 |
| ජංගම වගකීම් | | |
| වෙළඳ ණයහිමි | 70,000 | 30,000 |
| ජංගම ගිණුම් - Q සීමිත සමාගම | 40,000 | - |
| අනෙකුත් වගකීම් | 52,000 | 22,000 |
| මුළු ජංගම වගකීම් | 162,000 | 52,000 |
| මුළු වගකීම් | 262,000 | 72,000 |
| මුළු හිමිකම් සහ වගකීම් | 1,012,000 | 528,000 |

අතිරේක තොරතුරු පහත දැක්වේ.

1. වර්ෂය තුලදී Q සීමිත සමාගම P සීමිත සමාගමට 25 % ක පිරිවැය එකතු කළ අගයට භාණ්ඩ විකුණන ලදී. වර්ෂය අවසානයේදී P සීමිත සමාගමේ අවසන් තොගයෙහි Q සීමිත සමාගමෙන් මිලදී ගත් රු. 8,000 ඉන්වොයිස් වටිනාකමක් ඇති භාණ්ඩ ඇතුලත් වේ.

2. ජංගම ගිණුම් අතර වෙනසට හේතුව වන්නේ 2016.03.31 දින P සීමිත සමාගම Q සීමිත සමාගමට ගෙවූ මුදල් Q සීමිත සමාගමට තවමත් නොලැබීමයි.

3. එකිනෙක සමාගමෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශණ වල සඳහන් වන ලැබියයුතු සහ ගෙවියයුතු ශේෂයන්ගෙන් නිරූපණය වන්නේ P සීමිත සමාගම Q සීමිත සමාගමෙන් මිලදී ගත් භාණ්ඩ සඳහා ගෙවූ රු. 7,500/=

4. කීර්තිනාමය 10 % කින් කපාහැරීමට තක්සේරු කර ඇත.

2016.03.31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය පිළියෙල කරන්න.

( මුළු ලකුණු 35)

02. දීපා සීමිත සමාගම 2016.03.31 දින ඈවරකිරීමට තීරණය කරන ලදී. 2012.03.31 දින රු. 260,000 සාමාන්‍ය සංචිත සහ රු. 200,000 ලාභ විය. 2013/2014 වර්ෂයේදී සමාගම රු. 492,000 ලාභ ඉපැයූ නමුත් ඉන්පසුව 2014/2015 තුලදී රු. 1,900,000/- සහ 2015/2016 දී රු. 1,100,000/- ක වෙළඳ අලාභ ලැබීය.

2013/2014 දී සමාගම රු. 60,000 වරණීය ලාභාංශද රු. 50,000 සාමාන්‍ය ලාභාංශද ගෙවීය. 2015/2016 සඳහා ගිණුම් පිළියෙල කර නොමැත. ආදායම් බදු අධිකාරීන් බදු නොගෙවීම නිමිති කරගෙන රු. 110,000 ක දඩයක් පනවා ඇත. තවද රු. 40,000 තොග හානියක් වර්ෂය තුලදී වාර්තා වේ.

ඇවරකිරීමේ අරමුණ සඳහා වත්කම් පහත පරිදි විකුණන ලදී.

| | (රු 000) |
|---|---|
| ඉඩම් ( පොත් අගය රු. 1800,000) | 1,930 |
| ගොඩනැගිලි (පොත් අගය රු. 1400,000) | 1,200 |
| ඉඩම් මත උකස | 1,500 |
| ගොඩනැගිලි මත උකස | 1,600 |
| වෙළඳ ණයගැති | 130 |
| - අඩමාණ (75 % ක් ලැබේ යැයි තක්සේරු කර ඇත) | 100 |
| අතැති මුදල් | 1.5 |
| යන්ත්‍ර ( පොත් අගය රු. 1050,000) | 872 |
| තොග ( පිරිවැයට රු. 100,000) | 150 |
| කාර්යාලය සඳහා ගෙවූ අත්තිකාරම් රු.50,000 ක් වන අතර ඉන් ආපසු ගෙවීමට එකඟ වූ මුදල | 24 |
| වෙළඳ ණයහිමියන් රු. 1970,000 වන නමුත් සමාගම ගෙවිය යුතු වටිනාකම | 2,000 |

ඉහත තොරතුරු භාවිතා කරමින් ඌනතා ගිණුම පිළියෙල කරන්න.

( මුළු ලකුණු 30)

03. 2016.03.31 වර්ෂය සඳහා AB සමූහයේ තොරතුරු පහත දී ඇත.

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශණය

| | රු මිලියන |
|---|---|
| දල ලාභය | 3,325 |
| ක්ෂය | (225) |
| පරිපාලන, විකුණුම් සහ අනෙකුත් වියදම් | (1135) |
| පොලී වියදම් | (200) |
| බදු පෙර ශුද්ධ ලාභය | 1765 |
| ආදායම් මත බදු | (150) |
| ශුද්ධ ලාභය | 1615 |

ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශණ

| | 2016.03.31 | 2015.03.31 |
|---|---|---|
| **වත්කම්** | | |
| දේපල පිරියත හා උපකරණ | 9120 | 3400 |
| ආයෝජන | 10,000 | 10,000 |
| තොග | 4,000 | 7,800 |
| ලැබියයුතු ගිණුම් | 7,600 | 4,800 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1640 | 640 |
| | 32,360 | 26,640 |
| **හිමිකම් සහ වගකීම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 6,000 | 5,000 |
| රඳවාගත් ලාභ | 7,135 | 5,520 |
| දිගුකාලීන ණය | 15,705 | 4,160 |
| ගෙවියයුතු ආදායම් බදු | 1,600 | 4,000 |
| ගෙවියයුතු පොලී | 920 | 400 |
| ණයහිමි | 1,000 | 7,560 |
| | 32,360 | 26,640 |

අතිරේක තොරතුරු

වර්ෂය තුලදී උපසමාගමේ සියලුම කොටස් රු. මිලියන 2,360 කට අත්පත් කරගන්නා ලදී. අත්පත් කරගත් වත්කම් සහ වගකීම් වල සාධාරණ අගයන් පහත වේ.

| | රු. මි |
|---|---|
| දේපල පිරියත හා උපකරණ | 200 |
| තොග | 400 |
| ලැබිය යුතු ගිණුම් | 400 |
| මුදල් | 160 |
| දිගුකාලීණ ණය | 800 |
| ණයහිමි | 400 |
| | 2,360 |

ඔබ විසින් ඒකාබද්ධ මූදල් ප්‍රවාහ ප්‍රකාශණය පිළියෙල කළ යුතුය.

(මුළු ලකුණු 20)

04. GHS සමාගම රු. 10 ණයකර 20,000/= (20 %) ක් රු. 8 ට නිකුත් කරන ලදී. අයඳුම්පත් 35,000 ක් ලද අතර විභජනයෙන් පසු අතිරේක මුදල් ආපසු යවන ලදී. ඔබ විසින් අවශ්‍ය ගිණුම් පිළියෙල කළයුතුය.

(මුළු ලකුණු 08)

05. අ. " ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම මව් සමාගමට අත්‍යාවශ්‍යයය " සාකච්ඡා කරන්න.

( ලකුණු 03 )

ආ. " ඍජු පිරිවැය " සහ " වක්‍ර පිරිවැය " යන පද අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 07)